ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
இலங்கை உழைக்கும் ஊடகவியலாளர்கள் சங்கம்
Sri Lanka Working Journalists Association
SLWJA
T.P: +94112439276 www.slwjalk.org slworkingjournalist@gmail.com
Incorporated by Act no 46 in 1987 / Trade Union Registration No 8528

**NO.276/3, PRADEEPA MAWATHA, MALIGAWATTA, COLOMBO – 10, SRI LANKA**

2026 ජූලි 16

අනුර කුමාර දිසානායක මහතා
ජනාධිපති ලේකම් කාර්යාලය,
කොළඹ 01.

ගරු ජනාධිපතිතුමනි,

**මාධ්‍යවේදීන් වෙත සිදුකරන යුද හමුදා සහ පොලිස් හිරිහැර වහා නවතනු!**

'ද මෝනින්' (The Morning) පුවත්පතේ වෙබ් අඩවි කර්තෘ සහ තුර්කි රාජ්‍ය රූපවාහිනියේ (TRT) ශ්‍රී ලංකා නිල ප්‍රවෘත්ති සම්බන්ධීකාරක මෙන්ම අප සංගමයේ ද සාමාජිකයෙකු වන මාධ්‍යවේදී ලහිරු දොලොස්වල මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් වෙත ඊයේ (ජූලි 15) දින සිදු වූ අමානුෂික සහ අනීතික හමුදා සහ පොලිස් හිරිහැර කිරීම් ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය (SLWJA) වශයෙන් අපි දැඩි පිළිකුළෙන් යුතුව හෙළා දකිමු. රටේ නීතිය හා සාමය ආරක්ෂා කිරීමට බැඳී සිටින ආරක්ෂක අංශ විසින්ම සිවිල් පුරවැසියන්ගේ සහ මාධ්‍යවේදීන්ගේ මූලික අයිතිවාසිකම් මේ අයුරින් පාගා දැමීම බරපතළ තත්ත්වයකි.

මාධ්‍යවේදී ලහිරු දොලොස්වල මහතා සිය රාජකාරි කටයුතු නිමවා බිරිඳ සහ දරු දෙදෙනා ද සමඟ වාහනයෙන් නිවස බලා යමින් සිටියදී, මේජර් ජෙනරාල් නිලයට අයත් තරු තුනේ ලකුණ සහිත යුද හමුදාපතිවරයාගේ නිල රථය (යුහ 0001) සඳහා පරිවාරක රථයක් ලෙස ගමන් ගත්, යුහ 18035 දරණ ලෑන්ඩ් කෲසර් (Land Cruiser) මෝටර් රථය පිටුපසින් පැමිණ දොලොස්වල මහතාගේ වාහනයේ ගැටී අනතුරක් සිදු කර ඇත.

අනතුරින් පසුව දොලොස්වල මහතා ජංගම දුරකතනයෙන් එම ස්ථානය වීඩියෝ පටිගත කිරීමට උත්සාහ කළ අවස්ථාවේදී, අදාළ පරිවාරක රථයේ ආරක්ෂක නිලධාරියා ලෙස කටයුතු කළ කොමාන්ඩෝ (මේජර්) නිලධාරියා විසින් එය වහා නවත්වන ලෙසත්, සිද්ධිය මාධ්‍යට දැනුම් නොදෙන ලෙසත් පවසමින් දරුණු ලෙස තර්ජනය කර තිබේ. මෙම බලහත්කාරී හැසිරීම හේතුවෙන් වාහනය තුළ සිටි ඔහුගේ බිරිඳ සහ කුඩා දරු දෙදෙනා දැඩි තැතිගැන්මකට හා මානසික කම්පනයකට පත්ව ඇත.

දොලොස්වල මහතා මේ පිළිබඳව පැමිණිලි කිරීමට වැලිකඩ පොලිස් ස්ථානයට ගිය අවස්ථාවේදී, එහි පැමිණි යුද හමුදාපතිවරයාගේ ආරක්ෂක නිලධාරීන් ඇතුළු 30 දෙනෙකුගෙන් පමණ සමන්විත හමුදා පිරිසක් පොලිසිය ද සමඟ එක්ව ඔහුට තර්ජනය කරමින්, යුද හමුදා රියදුරාට එරෙහිව පැමිණිලි කිරීමට බාධා පමුණුවා ඇත.

පසුව වැලිකඩ පොලිසියේ උසස් නිලධාරීන්ගේ මැදිහත් වීම මත AIB 396/183 අංකය යටතේ පැමිණිල්ල සටහන් කර ඇතත්, එහිදී ද හමුදා නිලධාරීන්ගේ තර්ජන මධ්‍යයේ පොලිසිය විසින් එම පැමිණිල්ල විකෘති කර ලියා ඇත. පසුව තර්ජනය කොට දොලොස්වල මහතාගෙන් ඊට අත්සන ලබාගෙන තිබේ. එමෙන්ම, ඔහුගේ ජංගම දුරකතනයේ තිබූ සිද්ධියට අදාළ දර්ශන බලහත්කාරයෙන් මකා දමා ඇති අතර, මෙම අනතුර සම්බන්ධයෙන් කිසිදු මාධ්‍ය ආයතනයකට දර්ශන ලබා නොදෙන ලෙසත්, එසේ කළහොත් බරපතළ ප්‍රතිවිපාකවලට මුහුණ දීමට සිදුවන බවටත් තර්ජනය කර ඇත. පැය 4කට අධික කාලයක් මුළුල්ලේ මුදාහළ

| President | General Secretary | Treasurer | National Organizer |
|---|---|---|---|
| Ranga Bandaranayake | Mithun Jayawardhana | S. Nishantha | Shantha Wijesooriya |
| +94777747839 | +94771508661 | +94779076532 | +94775282133 |
| rangaban@yahoo.com | mithunjayawardhana02@gmail.com | nisnishan88@gmail.com | shanthawijesooriya@gmail.com |

ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය
இலங்கை உழைக்கும் ஊடகவியலாளர்கள் சங்கம்
Sri Lanka Working Journalists Association
SLWJA
T.P: +94112439276 www.slwjalk.org slworkingjournalist@gmail.com
Incorporated by Act no 46 in 1987 / Trade Union Registration No 8528

**NO.276/3, PRADEEPA MAWATHA, MALIGAWATTA, COLOMBO – 10, SRI LANKA**

මෙම මිලේච්ඡ තර්ජනයන් හමුවේ දොලොස්වල මහතා සහ ඔහුගේ පවුලේ සාමාජිකයන් පත් වූ දැඩි මානසික කම්පනය තවමත් පහව ගොස් නොමැත.

රටේ ජනමාධ්‍යවේදීන් ඇතුළු පොදු මහජනතාව වෙත යුද හමුදාවේත් පොලිසියේත් ඇතැම් නිලධාරීන් විසින් මුදාහරින මෙවැනි අනීතික තර්ජන සහ බලහත්කාරී හිංසන ක්‍රියාවන්ගෙන් යළි යළිත් තහවුරු වන්නේ රට තුළ නීතියේ ආධිපත්‍යය බිඳ වැටී ඇති බව සහ වත්මන් ආණ්ඩුව හමුවේ රට අරාජිකත්වයට පත්වෙමින් තිබෙන බවයි.

එබැවින්, සන්නද්ධ සේවාවන්හි සේනාධිනායකයා ලෙස රටේ ජනාධිපතිවරයාගෙන් සහ වගකිවයුතු බලධාරීන්ගෙන් ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය වශයෙන් ඉල්ලා සිටින්නේ රට තුළ ක්‍රියාත්මක වන මෙම අරාජික සහ අවාසනාවන්ත තත්ත්වයන් වහාම වැළැක්වීමට රාජ්‍ය නායකයා ලෙස සෘජුව මැදිහත් වී ක්‍රියාමාර්ග ගන්නා ලෙසයි. රාජකාරි බලතල අනිසි ලෙස භාවිත කරමින්, මාධ්‍යවේදී ලහිරු දොලොස්වල මහතා බියගන්වා, පොලිසියේ රාජකාරියටද බාධා පමුණුවමින් හමුදාවේ කීර්තිනාමයට ද කැළලක් එක් කළ මෙම අනීතික ක්‍රියාවට සම්බන්ධ සියලු හමුදා නිලධාරීන් සම්බන්ධයෙන් වහාම විධිමත් පරීක්ෂණයක් පවත්වා දැඩි විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ජනාධිපතිවරයාගෙන් ඉල්ලා සිටිමු.

මෙරට මාධ්‍ය නිදහස සහ පුරවැසි මානව අයිතිවාසිකම් සුරක්ෂිත කිරීම උදෙසා මෙම සිදුවීමට අදාළව අපක්ෂපාතී යුක්තියක් ඉටු වනු ඇතැයි ශ්‍රී ලංකා වෘත්තීය ජනමාධ්‍යවේදීන්ගේ සංගමය දැඩිව අපේක්ෂා කරයි. මෙකී තර්ජනය සම්බන්ධයෙන් ගනු ලබන ඉදිරි පියවර සම්බන්ධයෙන් අප අවධානයෙන් පසු වන අතර මේ පිළිබඳ අප සංගමය ද දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිමු.

ස්තූතියි,
මෙයට විශ්වාසී,

**රංග බණ්ඩාරනායක**
**සභාපති**

**මිථුන් ජයවර්ධන**
**ලේකම්**

**පිටපත්:**

- **මහජන ආරක්ෂ අමාත්‍යවරයා**
- **ජනමාධ්‍ය අමාත්‍යවරයා**
- **යුද්ධ හමුදාපතිවරයා**
- **පොලිස්පතිවරයා**


| President | General Secretary | Treasurer | National Organizer |
|---|---|---|---|
| Ranga Bandaranayake | Mithun Jayawardhana | S. Nishantha | Shantha Wijesooriya |
| +94777747839 | +94771508661 | +94779076532 | +94775282133 |
| rangaban@yahoo.com | mithunjayawardhana02@gmail.com | nisnishan88@gmail.com | shanthawijesooriya@gmail.com |